# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2050/5 - 2017 දෙසැම්බර් මස 18 වැනි සඳුදා - 2017.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

වයඹ පළාත් සභාව

**වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 03 දරන පශු සම්පත් ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2017.06.06 වැනි දින සම්මත කරන ලදුව, 2017.12.06 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

**ආර්. එම්. ආර්. එම්. රත්නායක,**
සභා ලේකම්,
වයඹ පළාත් සභාව.

2017 දෙසැම්බර් මස 13 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ,
සභා ලේකම් කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# වයඹ පළාතේ පළාත් සභාවේ
# 2017අංක 03 දරන පශු සම්පත් ප්‍රඥප්තිය

දීර්ඝ නාමය

වයඹ පළාත තුළ තිරසාර සංවර්ධනයක් උදෙසා වූ පළාත් පශු සම්පත්ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අරමුණු ළඟා කර ගැනීම සඳහාත් පශු සම්පත් සංරක්ෂණය, රැකගැනීම, වැඩිදියුණු කිරීම සහ සත්ත්ව රෝග වැලැක්වීම සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සඳහා ප්‍රතිපාදන සැලසීම සඳහාත් ඊට ආනුෂංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහාත් සහ 1998 අංක 04 දරන වයඹ පළාත් සත්ත්ව පාලන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1968 අංක 10, 1988 අංක 46 සහ 2009 අංක 10 දරන සංශෝධිත පනත්වලින් සංශෝධිත 1958 අංක 29 දරන සත්ත්ව පනත, 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනත, 1947 අංක 44 දරන ගෝ ඝාතක (සංශෝධිත) පනත, 1951 අංක 02 දරන ගෝ ඝාතක (සංශෝධිත) පනත, 1953 අංක 48 දරන ගෝ ඝාතක (සංශෝධිත) පනත, 1976 අංක 31 දරන ගෝ ඝාතක (සංශෝධිත) පනත, 1981 අංක 60 දරන ගෝ ඝාතක (සංශෝධිත) පනත යන සංශෝධිත පනත්වලින් සංශෝධිත 1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥා පනත, 1952 අංක 33 දරන වසංගත රෝග පනත, 1956 අංක 23 දරන ජලභීතිකා මර්දන පනත යන පනත් වලට අදාල වන පරිදි අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:

ලුහුඬු නාමය

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 03. දරන පශු සම්පත් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය

02. වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය.

ප්‍රඥප්තියේ අරමුණු

03. ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ:

(1) ජාතික ප්‍රතිපත්තියට සහ පළාතේ අවශ්‍යතාවලට අනුකූලව පශු සම්පත් ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා නියාමනයට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.

(2) වයඹ පළාත තුළ පශු සම්පත් සංරක්ෂණය, නියාමනය, රැකබලා ගැනීම, වැඩි දියුණු කිරීම, සත්ත්ව ආහාර සහ ඖෂධ නිෂ්පාදනය හා පරිහරණය සහ සත්ත්ව රෝග වැළැක්වීම සඳහා නෛතික ප්‍රතිපාදන සැලැස්වීම,

(3) වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම,

(4) වයඹ පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුව පිහිටුවීම,

(5) වයඹ පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු ගොවීන් සවිබල ගැන්වීම,

(6) වයඹ පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ කලාප හා ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු සහ ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවීම,

(7) නිසි ප්‍රමිතියෙන් යුතු පරිසර හිතකාමී ගොවිපල පවත්වාගෙන යාම හා සෞඛ්‍යාරක්ෂිත ගුණාත්මක සත්ත්ව නිෂ්පාදනයන් පළාත තුළ තහවුරු කිරීම.

(8) වයඹ පළාත් ක්ෂීර ප්‍රවර්ධන අරමුදල පිහිටුවීම හා කළමනාකරණය.

## 1 වන කොටස

## ප්‍රතිපත්ති සම්පාදනය, කළමනාකරණය හා නියාමනය

සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය හා සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය

04. ජාතික ප්‍රතිපත්තියට හා පළාතේ අවශ්‍යතාවයන්ට අනුව වයඹ පළාත තුළ සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය හා සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය කිරීම විෂයයභාර පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේය. ඒ සඳහා පළාත තුළ ස්ථාපිත ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප හා පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවල හා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සමූපකාර, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ යෝජනා ලබා ගත හැකි වන්නේය.

05. ඉහත 04 වන වගන්තියේ සඳහන් ආයතන , සංවිධාන හෝ පුද්ගලයන්ගේ යෝජනාද සැලකිල්ලට ගෙන වසර පහක් සඳහා වන පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම වසර 05 කට වරක් පළාත් අධ්‍යක්ෂවරයා විසින් සකස් කර පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේය. පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම

06. පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු වූවන්ට අවශ්‍ය වන පශු සම්පත්, සෞඛ්‍ය, අභිජනන, ව්‍යාප්ති, පුහුණු, අලෙවිකරණ, ප්‍රවර්ධන සහ පළාත්බද පර්යේෂණ ඇතුළු සේවාවන් විෂයභාර පළාත් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේය. සේවාවන් සැපයීම

07. ජාතික ප්‍රතිපත්තිය හා පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, සත්ත්ව ගහණය, දේශගුණික තත්ත්වයන් හා පරිපාලන සීමාවන් පදනම් කරගෙන සත්ත්ව සංවර්ධන උපදේශක කොට්ඨාස හා කලාප නිර්ණය කළ යුතු අතර, පරිපාලන සීමාවන් පදනම් කරගෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාසය නිර්ණය කළ යුතු ය. සත්ත්ව සංවර්ධන උපදේශක කොට්ඨාස, ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාස හා කලාප නිර්ණය කිරීම

08 පළාතේ පශු සම්පත් සංවර්ධන ක්ෂෙත්‍රයේ අවශ්‍යතාවයන් සඳහා පළාත්බද පර්යේෂණ කටයුතු පිළිබඳ ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම කළ හැකි වන්නේය. පළාත්බද පර්යේෂණ ආයතන පිහිටුවීම.

09. පශු සම්පත් සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන් සවිබල ගැන්වීමේ කාර්යය උදෙසා මානව සම්පත් සංවර්ධන අංශ හෝ ඒකක පිහිටුවිය හැක්කේය. මානව සම්පත් සංවර්ධන ඒකක පිහිටුවීම.

## II වන කොටස

### පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, සංයුතිය, බලතල හා කාර්යභාරය

10. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා අරමුණු ළඟාකර ගැනීම සඳහා වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යනුවෙන් දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුත්තේය. දෙපාර්තමේන්තුව පිහිටුවීම.

11. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ සියලු කටයුතු ඉටු කිරීමටද නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේය. දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

12. දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා යනුවෙන් හඳුන්වනු ලබන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු පන්තියේ පශු වෛද්‍ය නිලධාරියකු විෂයභාර අමාත්‍යවරයා විමසා, අදාළ සේවා ව්‍යවස්ථාවට අනුකූලව, වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේය. පළාත් අධ්‍යක්ෂවරයා පත් කිරීම.

13. දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක පළාත් අධ්‍යක්ෂවරුන්, විෂයානුබද්ධ විශේෂඥවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරින්, පශු වෛද්‍ය නිලධාරින්, සත්ත්ව පාලන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සහ අනෙකුත් සහාය කාර්යය මණ්ඩල පත් කල හැකි වන්නේය. දෙපාර්තමේන්තුවේ සංයුතිය.

14. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන් සහ සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවා සේ සැලකිය යුතු වන්නේය. කාර්යය මණ්ඩල පත් කිරීම.

15. (1) මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන සහ ඊට ආනුෂංගික කාරණා සඳහා පනවනු ලබන නියෝග හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය. පළාත් අධ්‍යක්ෂවරයා සතු බලතල හා වගකීම්.

(2) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් වෙත පවරා ක්‍රියාත්මක කළහැකි වන්නේය.

(3) දෙපාර්තමේන්තුව සතුව පවතින චංචල හා නිශ්චල දේපළ ඇතුළු සියලු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා ලේකම්වරයාට වගකිවයුතු වන්නේය.

ගොවිපල හෝ නිෂ්පාදනාගාර පරීක්ෂා කිරීමේ බලය

16. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඕනෑම අවස්ථාවක ගොවිපලකට හෝ නිෂ්පාදනාගාරයකට හෝ අලෙවිසලකට හෝ ශීතකරණ මධ්‍යස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීමේ බලය පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකුට ඇත්තේය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ හෝ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින බලය ලත් නිලධාරියෙකුට බාධා කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුත්තේය.

(3) ඉහත 16(1) වන උපවගන්තිය යටතේ පරීක්ෂාවක් කරන නිලධාරියෙකු වෙත ස්වකීය කාර්යභාරය යටතේ අවශ්‍ය වන්නා වූ නියැදි හෝ තොරතුරු සැපයීමට එසේ පරීක්ෂාවට ලක් වූ ස්ථානයේ අයිතිකරු හෝ එම ස්ථානය භාරව සිටින තැනැත්තෙකු හෝ එහි සිට හමුවන සෑම තැනැත්තෙකු ම බැඳී සිටිය යුත්තේය.

(4) සම්මත ක්‍රමයට නියැදි හෝ තොරතුරු ලබා ගැනීමේ නිරතව සිටින නිලධාරියෙකුට කිසිදු අයුරකින් අසත්‍ය හෝ නොමග යවන නියැදි හෝ තොරතුරු සැපයීම නොකළ යුත්තේය.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා වගකීම.

17. පළාත තුළ පශු සම්පත් සංවර්ධනය, සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිය සහ නියාමනය සඳහා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වන්නේය.

(1) පස් අවුරුදු සැලැස්මට අනුකූලව වාර්ෂික සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.

(2) සත්ත්ව රෝග පාලනය, වැලැක්වීම හා ප්‍රතිකාර කටයුතු මගින් සතුන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම.

(3) පළාත් අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පරිසරයට ගැලපෙන, ආරය උසස් සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාම සඳහා අභිජනන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(4) ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(5) නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) පළාත්බද පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම සහ ප්‍රතිඵල සමාජගත කිරීම.

(7) පළාතට යෝග්‍ය නව තාක්ෂණය හා ගොවිපල යාන්ත්‍රිකරණය හඳුන්වා දීම.

(8) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල හා සත්ත්ව පාලනයට සම්බන්ධ වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(9) සත්ත්ව ගොවිපල සංවර්ධනයට අවශ්‍ය උසස් තත්ත්වයේ අභිජනන හා රෝපණ ද්‍රව්‍ය හඳුන්වාදීම, බෙදාහැරීම සහ අලෙවිය.

(10) පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ පහත සඳහන් සියලු ආයතන, සංවිධාන සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීම. බලපත්‍ර නිකුත් කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම.

I. ග්‍රාමීය සමිති හා ප්‍රාදේශීය හා කලාප පශු සම්පත් සංවර්ධන කමිටු.
II. සත්ත්ව ගොවිපල.
III. සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ, රසායන වර්ග, උපකරණ නිෂ්පාදනාගාර හෝ නිෂ්පාදකයන්.
IV. සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ, රසායන වර්ග හෝ උපකරණ බෙදාහරින ආයතන හෝ බෙදාහරින්නන් හෝ අලෙවිසල්.
V. පළාත තුළ සියලුම පශු නිෂ්පාදන ශීතාගාර.
VI. පළාත තුල නිෂ්පාදිත පශු සම්පත් මිලදී ගන්නා ආයතන.
VII. ජංගම අලෙවිකරුවන්.
VIII. සතුන් රැකගන්නන්,බෙදාහරින්නන් හා අලෙවිකරුවන්.
IX. පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයන්.

(11) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ සියලුම දත්ත පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(12) සත්ත්ව නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිත බව හා ගුණාත්මක බව තහවුරු කිරීම සහ ගොවිපල ප්‍රමිතිකරණය.

(13) පළාතේ අවශ්‍යතාවයන්ට අනුව රසායනාගාර පවත්වාගෙන යාම.

(14) පළාත තුළ සත්ත්ව රෝග වැලැක්වීම හා පාලනය කිරීම.

(15) සත්ත්ව ගොවිපල, නිෂ්පාදනාගාර, ශීතාගාර. අලෙවිසල් සම්මත ප්‍රමිතීන්ට අනුව පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යාමට විධිවිධාන සැලැස්වීම හා නියාමනය කිරීම.

(16) සතුන්ගෙන් මිනිසාට බෝවන රෝග පාලනය හා වැලැක්වීම.

(17) සත්ත්ව සුබසාධනය තහවුරු කිරීම.

(18) සතුන් ප්‍රවාහනයට අදාළව සත්ත්ව අනන්‍යතා සහතික , සෞඛ්‍ය සහතික සහ යෝග්‍යතා සහතික නිකුත් කිරීම.

(19) ග්‍රාමීය සමිති, ප්‍රාදේශීය හා කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල ගිණුම් පරීක්ෂා කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

(20) සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ හා රසායන වර්ග, උපකරණ නිෂ්පාදනය, ගබඩා කිරීම, අලෙවිය හා පරිහරණය සම්බන්ධ කටයුතු නියාමනය කිරීම.

(11) පශු මහජන සෞඛ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම.

(12) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පළාත්බද ප්‍රදර්ශන, උත්සව හා තරග සංවිධානය සහ ක්ෂේත්‍රයේ නියුතු වූවන් ඇගයීම.

වාර්ෂික සැලැස්ම හා කාර්යය සාධන වාර්තා.

18. (1) මෙම ප්‍රඥප්තියේ 05 වන වගන්තියේ විධිවිධානවලට අනුව සකස් කරනු ලබන පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම පදනම් කර ගනිමින්, පළාත තුළ ඇති පශු සම්පත් ආයතන සංවර්ධනය හා සත්ත්ව පාලන කටයුතුවල ප්‍රවර්ධනය සඳහා වූ ඉදිරි වසරේ වාර්ෂික සංවර්ධන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර අධ්‍යක්ෂවරයා විසින් සකස් කර ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වන්නේය.

(2) සෑම ලිත් වර්ෂයකටම අදාළ වාර්ෂික කාර්යය සාධන වාර්තාව ඊළඟ වසරේ මාර්තු මස 15 වැනි දිනට පෙර අධ්‍යක්ෂවරයා විසින් සකස් කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

## III වන කොටස

### ආයතන සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීම.

ආයතන හා පුද්ගලයින් ලියාපදිංචි කිරීම.

19. වයඹ පළාත තුළ පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ පහත සඳහන් සියළු සංවිධාන සහ පුද්ගලයින්, අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් ලබාගත යුතු අතර එය වාර්ෂිකව අළුත් කළ යුතු ය.

(1) ග්‍රාමීය සමිති හා ප්‍රාදේශීය හා කලාප පශු සම්පත් සංවර්ධන කමිටු:

(2) සත්ත්ව ගොවිපල:

(3) සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ, රසායන වර්ග, උපකරණ නිෂ්පාදනාගාර හෝ නිෂ්පාදකයන්:

(4) සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ, රසායන වර්ග හෝ උපකරණ බෙදාහරින ආයතන හෝ බෙදාහරින්නන් , අලෙවිසල් හෝ ගබඩා:

(5) පළාත තුළ සියළුම පශු නිෂ්පාදන ශීතාගාර:

(6) පළාත තුළ නිෂ්පාදිත පශු සම්පත් මිලදී ගන්නා ආයතන:

(7) ජංගම අලෙවිකරුවන්:

(8) සතුන් රැකගන්නන් ,බෙදාහරින්නන් හා අලෙවිකරුවන්:

(9) පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ සියළු ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයන්.

*ලියාපදිංචිය සඳහා අවශ්‍යතා.*

20. ඉහත 19 වන වගන්තිය යටතේ ලියාපදිංචිය ලබා ගැනීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුත්තේය:

(1) පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයකින් අයදුම් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතු ය:

(3) මෙම ප්‍රඥප්තියේ 84(1)වන උපවගන්තියේ නියෝගවලින් නියම කර ඇති නිර්නායක හා ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය:

(4) මෙම ප්‍රඥප්තියේ නියමයන්ට අතිරේකව වෙනත් ආයතන විසින් සම්පූර්ණ කළ යුතු යැයි නියම කරනු ලබන අනෙකුත් නීතිමය අවශ්‍යතා සපුරා තිබිය යුතු ය.

*ලියාපදිංචි සහතික අන්සතු නොකළ යුතු බව.*

21. පළාත් අධ්‍යක්ෂවරයාගේ අනුමැතියකින් තොරව ලියාපදිංචි සහතිකයක් පැවරීම හෝ අන්සතු කිරීම හෝ එහි ඇතුළත් තොරතුරු වෙනස් කිරීම හෝ නොකළ යුතු ය.

*ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම.*

22. මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා කරනු ලබන ඉල්ලීමක් 20 වන වගන්තිය යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොකරන්නේ නම් ලියාපදිංචි නොකළ යුතු අතර ප්‍රතික්ෂේප කිරීමට හේතු සමග ඒ බව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුත්තේය.

*ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම.*

23. (1) ඉහත 19 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයක්,පුද්ගලයෙක් හෝ සංවිධානයක් මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට පටහැනිව කටයුතු කරන බවට හෝ නියෝග මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන බවට හෝ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම සිදුකළ හැකිය.

(2) ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීමේ දී එසේ කිරීමට හේතු වූ කරුණු අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි සහතිකයේ හිමිකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) ලියාපදිංචිය තාවකාලිකව අත්හිටවූ අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන සාධාරණ කාලයක් තුළ දී ඊට හේතු වූ කරුණු නිවැරදි කර අදාළ අවශ්‍යතා සම්පූර්ණ කරන අවස්ථාවක ලියාපදිංචිය නැවත ලබාදිය යුතු ය.

*ලියාපදිංචිය අවලංගු කිරීම.*

24. මෙම ප්‍රඥප්තියේ 23(3) වන උපවගන්තියට අනුව නියම කරන ලද සාධාරණ කාලය තුළ අදාළ අවශ්‍යතා සම්පූර්ණ නොකරන්නේ නම් ලියාපදිංචිය අවලංගු කර ඒ බව ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැන්විය යුතුය.

*ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වන අභියාචනා.*

25. මෙම ප්‍රඥප්තියේ 22 වන වගන්තිය යටතේ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ බවට හෝ 24 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කළ බවට දැන්වීමක් ලැබී දින 45 ක් ඇතුළත අදාළ පාර්ශවය විසින් ඊට එරෙහිව විෂයයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේය.

26. (1) මෙම ප්‍රඥප්තියේ 25 වන වගන්තිය යටතේ අභියාචනයක් ලද අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කොට නිර්දේශය ලබාදීමට අමාත්‍යවරයා විසින් ලේකම්වරයාට නියම කළ යුතු ය.

*අභියාචනා බලතල.*

(2) ලේකම්වරයා විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරයාගේ තීරණය තහවුරු කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(3) අභියාචනය ලැබී දින 45 ක් ඇතුළත අමාත්‍යවරයාගේ තීරණය ලබාදිය යුතු අතර එම තීරණය අභියාචනය පිළිබඳ අවසාන තීරණය වන්නේය.

*ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හෝ අවලංගු කළ හෝ වසා දැමීමේ ආඥාව.*

27. (1) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව යම් ගොවිපලක්, ශීතාගාරයක්, නිෂ්පාදනාගාරයක් හෝ අලෙවිසලක් පවත්වා ගැනීමේ වරදට මෙම ප්‍රඥප්තියේ 92 වන වගන්තිය යටතේ යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ තිබියදීත් ඒ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල නොකඩවා පවත්වාගෙන යන අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තෙකු විසින් මහෙස්ත්‍රාත් අධිකරණයෙන් වැසීමේ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත ඒ තැනැත්තා නැවත බලපත්‍රයක් ලබා ගන්නා තුරු ඒ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල වසා දැමීමේ ආඥාවක් එකී අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකිය.

(2) ඉහත වගන්තිය යටතේ වූ නඩු කටයුත්තක දී අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධාරියකු විසින් නිකුත් කරන ලද සහතිකය, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බලපත්‍රයක් නොමැතිව එකී ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල දිගටම පවත්වාගෙන යනබව දක්වමින් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) එසේ වුව ද මෙම ප්‍රඥප්තියේ 25 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක අභියාචනා පරීක්ෂණයේ තීන්දුව ලැබෙන තෙක් වසා දැමීම ප්‍රමාද කළ යුතු වන්නේය.

(4) මෙම ප්‍රඥප්තියේ 23(2) වන උපවගන්තිය යටතේ හා අභියාචනා පරීක්ෂණයෙන් අධ්‍යක්ෂවරයාගේ තීරණය තහවුරු වූ අවස්ථාවක එම තීන්දුව ලබාදුන් දින සිට දින 30 ක් ඇතුළත වසා දැමීමට කටයුතු කළ යුතු ය.

28. පළාත් අධ්‍යක්ෂවරයා විසින් පළාතේ සත්ත්ව සුභ සාධනය පවත්වාගෙන යාමට තර්ජනයක් බවට හඳුනා ගන්නා අවස්ථාවක එයට අදාළව තාවකාලික වසා දැමීමේ ආඥාවක් ඔහු මහෙස්ත්‍රාත් අධිකරණයකින් ලබා ගත යුතු ය. විශේෂ අවස්ථාවක දී වසා දැමීමේ ආඥාව.

29. (1) 27 (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ වගන්තියෙහි වූ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයාට නියම කළ යුතු අතර, ඒ ආඥාවෙහි සඳහන් ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර, ඒ පිස්කල්වරයා විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. වසා දමීම.

(2) එකී ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල වසා දැමීම සඳහා එකී පිස්කල්වරයා හෝ එකී කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධාරියකු විසින් අවශ්‍ය යැයි සලකන යම් සහායකයන් ද සමග එම ගොවිපලට, ශීතාගාරයට, නිෂ්පාදනාගාරයට හෝ අලෙවිසලට ඇතුල් වීමට ඒ ආඥාව ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධාරියාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේය.

## IV වන කොටස

### පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුව

30. පළාත් පශු සම්පත් ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාවට නැංවීම පහසු වනු පිණිස පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේය. පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයා මෙම කමිටුවේ සභාපතිවරයා වන අතර පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වන්නේය. මෙම කමිටුව පළාත් කෘෂිකර්ම කමිටුව හා පළාත් වාරිමාර්ග කමිටුව සමග ඒකාබද්ධව පැවැත්විය හැකි වන්නේය. පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුව.

31. (1) මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය. කමිටුවේ සංයුතිය.

I. පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පශු වෛද්‍ය නිලධාරි කලාප නියෝජනය වන පරිදි නම් කරනු ලබන මන්ත්‍රීවරුන් පස් දෙනෙකු.

II. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් දෙදෙනෙකු.

III. වයඹ පළාත් ජ්‍යෙෂ්ඨ පොලිස්පති හෝ ඔහුගේ නියෝජිතයෙකු.

IV. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ.

V. වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ.

VI. වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ.

VII. වයඹ පළාත් ඉඩම් කොමසාරිස්.

VIII. වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

IX. වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්.

X. කුරුණෑගල ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් සහ පුත්තලම ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

XI. වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ.

XII. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලද නියෝජිතයෙකු.

XIII. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කළමණාකරුවන්.

XIV. පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්.

XV. රාජ්‍ය බැංකුවල නියෝජිතයන්.

XVI. පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පළාත් නියෝජිතයෙකු.

XVII. කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල සභාපතිවරු

XVIII. සත්ත්ව නිෂ්පාදන සම්බන්ධ ප්‍රධාන ආයතනවල ප්‍රධානීන් තිදෙනෙකු.

XIX. කිරි මිලදී ගන්නා අනුපිළිවෙල අනුව ප්‍රධාන කිරි මිලදී ගන්නා ආයතනවල නියෝජිතයන් තිදෙනෙකු.

(2) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවන් සඳහා පශු සම්පත් සංවර්ධනයට සම්බන්ධ සංවිධාන සහ ආයතනවල නියෝජිතයන් හෝ පුද්ගලයන් අවශ්‍යතාවය අනුව කමිටුවට කැඳවිය හැක්කේය.

පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවේ සාමාජිකයින් පත් කිරීම.

32. මෙම ප්‍රඥප්තියේ 31(1) වන උපවගන්තියේ I සිටXVII දක්වා සාමාජිකයින් නිල බලයෙන් පත් වන අතර XVIII සිට XIX දක්වා සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත් කළ හැක්කේය.

පත්කල සාමාජිකයින්ගේ ධුරකාලය.

33. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධුර කාලය වසර දෙකක් වන්නේය.

සාමාජිකත්වය අහෝසිවීම හා පුරප්පාඩු පිරවීම.

34. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධුර කාලය සම්පූර්ණවීම, ධුරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කිරීම, අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවීම, සාමාජිකයෙකුගේ මරණය හෝ සිහිවිකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන අතර එම පුරප්පාඩු අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වන්නේය.

කමිටුවේ රැස්වීම.

35. පළාත් කමිටුව මාස දෙකකට එක් වරක් බැගින් රැස්විය යුතු වන්නේය. අවශ්‍ය වන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැකිය.

ගණ පූර්ණය.

36. (1) කමිටුවේ ගණ පූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතු ය.
(2) සාමාජිකයන්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේය.

කමිටුවේ බලතල හා කාර්යභාරය.

37. පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුවේ බලතල හා කාර්යභාරය පහත පරිදි වේ.

(1) ජාතික ප්‍රතිපත්තියට හා පළාත් අවශ්‍යතාවනට අනුකූලව සහ ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම.

(2) ප්‍රඥප්තියේ සඳහන් කාරණා මෙහෙයවීමට හා ක්‍රියාවේ යෙදවීමට අදාළ උපදෙස් ලබා දීම.

(3) පශු සම්පත් සංවර්ධන පස් අවුරුදු සැලැස්ම සහ කමිටුවට ඉදිරිපත් කරන මධ්‍යකාලීන, දිගුකාලීන හා අනිකුත් සංවර්ධන සැලසුම් අනුමත කිරීම.

(4) පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්, මග පෙන්වීම් සහ සහනය ලබාදෙමින් ඒ පිළිබඳ පසු විපරම හා ඇගයීම.

(5) පළාත තුළ කිසියම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් පශු සම්පත් ව්‍යාපෘතිය ප්‍රවර්ධනය, අධ්‍යාපනය, සේවා සැපයීම සහ පර්යේෂණ උදෙසා කිසියම් ව්‍යාපෘතියක්, වැඩ සටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබාදීම හා කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවල ඒ සම්බන්ධව කටයුතු කිරීම.

(6) පළාත් පශු සම්පත් කමිටුව සඳහා ඉදිරිපත් වන ගැටළු නිරාකරණය කිරීම.

38. (1) පළාත් කමිටුව විසින් එහි රැස්වීම්වල කාර්යය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය පරිපාටි සම්පාදනය කර ගත හැක්කේය. කාර්යය පරිපාටි හා සහභාගිත්ව දීමනා

39. (2) පළාත් කමිටුවේ රැස්වීම්වලට සහභාගිවන්නන් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය යටතේ ගෙවනු ලැබිය හැක්කේය.

## V වන කොටස

## ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති

39. ග්‍රාම නිලධාරි කොට්ඨාසයක හෝ කොටසක හෝ කීපයක සත්ත්ව පාලන කටයුතුවල යෙදී සිටින ගොවීන් ඒකරාශී වී සත්ත්ව පාලන ක්ෂේත්‍ර අනුව හෝ ඒකාබද්ධව ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවා ගත හැකි අතර, එම සෑම සමිතියක්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතු වන්නේය. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවීම හා ලියාපදිංචිය

40. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සියලු කටයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේය. නීතිගත ආයතනයක් බව

41. ග්‍රාමීය මට්ටමේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සංවිධානගත කර බලගැන්වීම තුළින් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම මෙම සමිති පිහිටුවීමේ අරමුණ වන්නේය. සමිති පිහිටුවීමේ අරමුණ

42. සමිතියේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් සමිතියේ සාමාජිකත්වය සඳහා සුදුසුකම්

(1) ශ්‍රී ලංකා පුරවැසියෙකුවීම.
(2) වයස අවුරුදු 18 ට නොඅඩු වීම.
(3) පශු සම්පත් සංවර්ධන සමිති බල ප්‍රදේශයේ ගොවිපල පිහිටා තිබීම.
(4) ගොවිපල සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම.

43. සෑම ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක් විසින්ම සමිතියේ නිලධාරීන් ලෙස සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම් සහ සාමාජිකයින් හයදෙනෙකුගෙන් සමන්විත කාරක සභාවක් පත්කර ගත යුතු අතර ඔවුන්ගේ ධුර කාලය පත් වූ දින සිට වසරක් වේ. සංයුතිය හා ධුර කාලය

44. (1) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් අනුමත කළ යුත්තේය. සමිති ව්‍යවස්ථාව

(2) එම ව්‍යවස්ථාව අනුව සෑම ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක්ම කටයුතු කළ යුතු වන්නේය.

45. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවල බලතල හා කාර්යභාරය පහත පරිදි වන්නේය. සමිති බලතල හා කාර්යභාරය

(1) පළාත් සැලැස්මට අනුකූලව ස්වකීය සමිති බල ප්‍රදේශය සඳහා පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා නියාමනය.

(2) සාමාජිකයන්ගේ ගොවිපල සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම හා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය.

(3) අදාල පශු සම්පත් ක්ෂේත්‍රයට ස්වකීය බල ප්‍රදේශය තුළ පැන නගින ගැටළුවලට විසඳුම් ලබාදීම.

(4) ක්ෂේත්‍රයට අදාළ දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙන යාම හා අවශ්‍ය අවස්ථාවලදී අදාළ පාර්ශවයන් වෙත ලබාදීම.

(5) සමිති සාමාජිකයින් සඳහා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) සමිතියේ අරමුදල වර්ධනය කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(7) සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම.

(8) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුව නියෝජනය සඳහා නියෝජිතයෙකු නම් කිරීම.

(9) රක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(10) නව ගොවීන් බිහි කිරීමට අවශ්‍ය වැඩ සටහන් සංවිධානය කිරීම.

**සමිති රැස්වීම් හා ගණ පූර්ණය**

46\. (1) සමිති රැස්වීම් මාසිකව හෝ ද්වි මාසිකව පැවැත්විය යුතු අතර සාමාජිකයන් බහුතරයකගේ ඉල්ලීම මත අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේය.

(2) සමිතියේ ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3 ක් විය යුතු ය.

**සාමාජිකත්වය හෝ ධූරය අහෝසි වීම**

47\. (1) පහත සඳහන් හේතූන් මත සමිතියේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

I. ඉල්ලා අස්වීම.

II. අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගී නොවීම.

III. මරණය හෝ සිහිවිකලත්වය.

IV. ව්‍යවස්ථාවට පටහැනි කටයුත්තක් සිදු කිරීම හෝ පශු සම්පත් ක්ෂේත්‍රයේ කටයුතුවලින් ඉවත්වීම හේතුවෙන් සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත ඉවත් කිරීම.

(2) සාමාජිකත්වය අහෝසිවීම මත හෝ ඉල්ලා අස්වීම මත හෝ සමිති සාමාජිකයින්ගේ බහුතර කැමැත්ත මත හෝ ධූරය අහෝසි වන්නේය.

**සමිතියේ අරමුදල්**

48\. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන අරමුදල පහත ප්‍රභවයන්ගෙන් සමන්විත වේ.

I. සාමාජික මුදල්.

II. රාජ්‍ය, පළාත් සහ රාජ්‍ය නොවන සංවිධාන ප්‍රදාන.

III. පුද්ගල පරිත්‍යාග.

IV. අරමුදලේ පොළී හා ලාභ.

V. වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල්.

**සමිති අරමුදලේ ගිණුම**

49\. (1) සමිති අරමුදලේ ගිණුම රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු අතර, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුව සමිති අරමුදලේ ගිණුම පවත්වාගෙන යා යුත්තේ ය.

(2) අරමුදලේ ගිණුම පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් වාර්ෂිකව හෝ අවස්ථානුකූලව පරීක්ෂා කළ යුත්තේය

**සමිති අධීක්ෂණය**

50\. (1) ස්වකීය බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවල කටයුතු අධීක්ෂණය, ලේඛන පරීක්ෂාව, මග පෙන්වීම හා උපදෙස් ලබාදීම සත්ත්ව සංවර්ධන උපදේශකවරයා වෙත පැවරෙන්නේ ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකුට වුවද ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති අධීක්ෂණය හා ලේඛන පරීක්ෂාව කළ හැක්කේ ය.

**ලියාපදිංචිය අවලංගු කිරීම හා ඇවර කිරීම**

51\. (1) ලියාපදිංචි ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක් පහත සඳහන් කාරණා එකක් හෝ කීපයක් හෝ මත ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා සහ ණයන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු ඇවරකරුවෙකු ලෙස පත් කළ යුතු වන්නේ ය.

I. සමිතියක සාමාජික සංඛ්‍යාව එකොළහකට වඩා අඩු වීම.

II. එක් අවුරුද්දක් ඉක්මවන කාලපරිච්ඡේදයක් තුළ සමිතිය ක්‍රියාත්මක නොවී තිබීම.

III. සමිති ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම.

IV. සමිතියෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් එම සමිතියේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු සංඛ්‍යාවක් විසින් ඇවර කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කිරීම.

(2) ඉහත 51(1) වන උපවගන්තිය යටතේ පත් කළ ඇවරකරුට විෂයයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ණ අනුමැතියට යටත්ව පහත සඳහන් බලතල ඇත්තේ ය.

I. සමිතියේ ණය හිමියන් අතර ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් තීරණය කිරීම.

II. සමිතියේ දේපළ විකිණීම.

III. සමිතිය විසින් හෝ ඊට එරෙහි හිමිකම්පෑම් සමතයකට පත් කිරීම.

IV. සමිතියේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම.

(3) ඇවරකරු විසින් කරනු ලබන අවලංගු කිරීම පිළිබඳ නිවේදනය පිළිවෙලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රවල පළ කරනු ලැබිය යුතු ය.

(4) සමිතිය ඇවර කිරීමේදී එහි අරමුදල ඇවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර, ඉක්බිතිව එහි බැරකම්වලින් නිදහස්වීම සඳහා යෙදවිය යුතු ය. ඇවර කිරීම නිම කිරීමෙන් පසුව ඉතිරිවන අතිරික්තය මතු සඳහන් ක්ෂීර ප්‍රවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## VI වනකොටස

### ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු

52. සෑම ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාසයක් සඳහාම ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවක් පිහිටුවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කළ යුතු වන්නේ ය. *ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු පිහිටුවීම හා ලියාපදිංචිය.*

53. (1) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් අනුමත කළ යුත්තේ ය. *කමිටු ව්‍යවස්ථාව*

(2) එම ව්‍යවස්ථාව අනුව සෑම ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවක්ම කටයුතු කළ යුතු වන්නේ ය.

54. (1) කමිටුවේ සංයුතිය පහත පරිදි වන්නේ ය. *කමිටුවේ සංයුතිය*

I. පශු වෛද්‍ය නිලධාරි.
II. මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි.
III. සත්ත්ව සංවර්ධන උපදේශකවරුන්.
IV. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන කෘෂි ප්‍රවර්ධන නිලධාරිවරයෙකු.
V. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නම් කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු.
VI. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන කෘෂිකර්ම උපදේශකවරයකු
VII. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති මගින් නම් කරනු ලබන නියෝජිතයින්.
VIII. පොල් සංවර්ධන මණ්ඩලයේ කලාප කළමනාකරු විසින් නම් කරනු ලබන පොල් සංවර්ධන නිලධාරිවරයෙකු
IX. ප්‍රාදේශීය ලේකම් විසින් ක්ෂේත්‍රයට අදාළව නම් කරනු ලබන නිලධාරිවරයෙකු
X. අදාළ පළාත් පාලන ආයතනයේ පරිසර නිලධාරිවරයා
XI. කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන වයඹ පළාත තුළ කිරි මිලදී ගන්නා සමාගම්වල ප්‍රාදේශීය නියෝජිතයින්.

(2) පත් කළ නියෝජිතයෙකු පුරප්පාඩු වූ අවස්ථාවක එම ක්ෂේත්‍රය නියෝජනය වන පරිදි පශු වෛද්‍ය නිලධාරිගේ නිර්දේශය මත කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් වෙනත් නියෝජිතයෙකු පත් කළ යුතු ය.

55. පශු සම්පත් ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනවල නියෝජිතයින් සඳහා කමිටුවේ අනුමැතිය මත ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත හැකි අතර, ඔවුන්ට ඡන්ද බලය හෝ නිලතල දැරීමේ හිමිකමක් නොමැත. *ආශ්‍රිත සාමාජිකත්වය*

56. කමිටුවේ සභාපති, ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති නියෝජිතයින්ගෙන් පත් විය යුතු අතර, ලේකම් නිල බලයෙන් කොට්ඨාසයේ පශු වෛද්‍ය නිලධාරිවරයා වන්නේ ය. *කමිටුවේ සභාපති හා ලේකම්*

57. නිල නොවන සාමාජිකයින්ගේ ධූර කාලය ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියේ ඔහුගේ ධූර කාලය අහෝසිවීම මත අහෝසි වන්නේ ය. *සාමාජිකයින්ගේ ධූර කාලය*

58. කමිටුවේ රැස්වීම මාස 03 කට වරක් පැවැත්විය යුතු අතර කමිටුවේ ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3 ක් විය යුතු ය. *කමිටු රැස්වීම හා ගණ පූර්ණය*

කමිටුවේ කාර්යභාරය

59. කමිටුවේ කාර්යභාරය පහත පරිදි වේ.

(1) පළාත් හා ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සැලසුම් පදනම් කරගෙන ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

(2) ප්‍රාදේශීය විභවතාවයන් අනුව විශේෂ ව්‍යාපෘති යෝජනා සකස් කර අදාල ආයතන සම්බන්ධීකරණය කරමින් ප්‍රතිපාදන සලසා ගැනීම.

(3) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය සහයෝගය හා දායකත්වය ලබාදීම.

(4) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවලින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

(5) විවිධ මූල්‍ය ප්‍රභවයන්ගෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාලව ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති වෙත ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යොදවන බවට වගබලා ගැනීම.

(6) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති හා කලාප පශු සම්පත් සංවර්ධන කමිටු අතර සම්බන්ධීකරණය.

(7) ප්‍රාදේශීය කමිටු බල ප්‍රදේශය සඳහා පශු සම්පත් ක්ෂේත්‍රයට අදාලව ලැබෙන ප්‍රතිපාදන ප්‍රතිලාභීන් වෙත වෙන් කිරීම.

(8) සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාල යෙදවුම් ප්‍රතිලාභීන්ට පහසුවෙන් ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කිරීම.

## VII වන කොටස

### කලාප පශු සම්පත් සංවර්ධන කමිටු

කලාප පශු සම්පත් සංවර්ධන කමිටු පිහිටුවීම හා ලියාපදිංචිය

60. මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ නිර්ණය කරනු ලබන සෑම කලාපයක් සඳහාම කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවක් පිහිටුවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කළ යුත්තේය.

කමිටු ව්‍යවස්ථාව

61. කලාප පශු සම්පත් සංවර්ධන කමිටු ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් අනුමත කළ යුත්තේය. එකී ව්‍යවස්ථාවට අනුව කලාප පශු සම්පත් සංවර්ධන කමිටු කටයුතු කළ යුතු වන්නේ ය.

කමිටුවේ සංයුතිය

62. මෙම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

(1) කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ.

(2) පළාත් අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන පශු වෛද්‍ය නිලධාරීන් හතර දෙනෙකු.

(3) දිස්ත්‍රික් ලේකම්ගේ නියෝජිතයෙකු.

(4) පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙකු

(5) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ නියෝජිතයෙකු.

(6) පළාත් පරිසර අධිකාරියේ නියෝජිතයෙකු.

(7) පළාත් අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන ජොෂ්ඨ සත්ව සංවර්ධන උපදේශකවරුන් හතර දෙනෙකු.

(8) පළාත් අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි.

(9) පශු විමර්ශන නිලධාරිවරයෙකු.

(10) කෘෂි රක්ෂණ මණ්ඩල නියෝජිතයෙකු.

(11) පළාත් අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ කිරි මිලදී ගන්නා සමාගම්වල නියෝජිතයින්.

(12) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවල සභාපතිවරු හෝ ඔවුන්ගේ නියෝජිතයින්.

ආශ්‍රිත සාමාජිකත්වය

63. පශු සම්පත් ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනවල නියෝජිතයින් සඳහා කමිටුවේ අනුමැතිය මත ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත හැකි අතර ඔවුන්ට ඡන්ද බලය හෝ නිලතල දැරීමේ හිමිකමක් නොමැත.

සභාපති හා ලේකම්

64. කමිටුවේ සභාපති ප්‍රාදේශීය පශු සම්පත් කමිටු සභාපතිවරුන් අතරින් පත්කර ගත යුතු අතර කලාපභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ නිල බලයෙන් ලේකම්වරයා වන්නේ ය.

65. නිල නොවන සාමාජිකයෙකුගේ ධූර කාලය ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවේ ඔහුගේ ධූර කාලය අහෝසිවීම මත අහෝසි වන්නේ ය. ධූර කාලය

66. රැස්වීම් මාස 04කට වරක් පැවැත්විය යුතු අතර ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3ක් විය යුත්තේ ය. විශේෂ අවස්ථාවන්හිදී සභාපතිවරයා දැනුවත් කර ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේය. කමිටු රැස්වීම් හා ගණ පූර්ණය

67. කමිටුවේ කාර්යභාරය පහත පරිදි වේ. කමිටුවේ කාර්යයභාරය

(1) කලාප පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරි දායකත්වය ලබා දීම,

(2) පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුව සමග සම්බන්ධීකරණය,

(3) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවලින් ඉදිරිපත් වන කරුණු සම්බන්ධව කටයුතු කිරීම,

(4) පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම,

(5) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු සම්බන්ධීකරණය,

(6) මතු සඳහන් ක්ෂීර ප්‍රවර්ධන අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සඳහා කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියෝජිතයන් තිදෙනෙකු නම් කිරීම.

## VIII වන කොටස

## ක්ෂීර ප්‍රවර්ධන අරමුදල

68. මෙහි මින් මතු ක්ෂීර ප්‍රවර්ධන අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවිය යුත්තේය. ක්ෂීර ප්‍රවර්ධන අරමුදල

69. අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් වන්නේය. අරමුදල නීතිගත සංස්ථාවක් බවට

70. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අරමුදලේ භාරකාරත්වය දරන්නේය. අරමුදලේ භාරකාරත්වය

71. ක්ෂීර ප්‍රවර්ධන අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවිය යුත්තේය. අරමුදලේ කළමනාකරණ මණ්ඩලය

72. (1) මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන ක්ෂීර ප්‍රවර්ධන අරමුදලේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය: කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

I. විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්,

II. වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),

III. මිල්කෝ ආයතනයේ ප්‍රාදේශීය කළමනාකරු හා පෞද්ගලික කිරි මිලදී ගන්නා ආයතන දෙකක නියෝජිතයින් දෙදෙනෙකු,

IV. කිරි ගව පාලන විෂයය ක්ෂේත්‍රයේ විශේෂඥවරයකු,

V. පශු සම්පත් සංවර්ධන කලාප කමිටු විසින් නම් කරන කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ කටයුතු කරන නියෝජිතයින් තිදෙනෙකු.

(2) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හා ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) හැර අනෙකුත් නියෝජිතයින් අමාත්‍යවරයා විසින්පත් කරනු ලැබිය යුතු ය.

73. (1) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය. කළමනාකරණ මණ්ඩලයේ සභාපති ලේකම්

(2) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා නිල බලයෙන් මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම, ධූර කාලය හා සාමාජිකත්වය අහෝසි වීම සහ නීතිමය පියවර.

74. (1) අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයෙකුගේ ධූරකාලය පත් කළ දින සිට වසර 3 ක් වන අතර ග්‍රාමීය හෝ කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල සාමාජිකත්වය අහෝසිවීම මත ධූර කාලය ද අහෝසි වන්නේය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු සිය ධූරයේ වගකීම් යථා පරිදි නොදරන බවට හෝ එම තනතුරු දැරීම හානිකර යැයි අමාත්‍යවරයාට තහවුරු වන ඕනෑම අවස්ථාවක එම ධූරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය.

(3) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකු එම නිලය දැරීම අවසන් වනවාත් සමග ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

(4) අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකුට හැර වෙනත් සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත්තේය.

(5) සාමාජිකයෙකුගේ මරණය හෝ සිහිවිකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන්නේය

(6) සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන්හෝඉවත්කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහානැවත පත්කරනු ලබන තැනැත්තෙකුගේ ධූර කාලය පූර්ව සාමාජිකයා පත්කරන ලද ධූර කාලයෙන් ඉතිරි කාලයට සීමා විය යුත්තේය.

(7) අරමුදලට අදාලව මූල්‍ය වංචාවක් හෝ අවභාවිතයක් අනාවරණය වූ ඕනෑම අවස්ථාවක ප්‍රධාන ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව ක්ෂණිකව නීතිමය ක්‍රියාමාර්ග ගත යුත්තේය.

දීමනාවක් ගෙවිය හැකි බව

75. මෙම මණ්ඩලයේ සාමාජිකයන්ට හා ලේකම්ට විෂයභාර අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන සහභාගිත්ව දීමනාවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව ගෙවිය හැක්කේය.

මණ්ඩලයේ ගණ පූර්ණය.

76. මණ්ඩලයේ ගණ පූර්ණය සභාපති ඇතුළුව අවම වශයෙන් 05 ක් විය යුත්තේය.

අරමුදලේ බැංකු ගිණුම

77. (1) අරමුදල නමින් ජංගම බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවක පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) අරමුදලට ලැබෙන සියළුම මුදල් එම ගිණුමට බැර කළ යුතු ය.

(3) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලද අතිරික්ත අරමුදල් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීමට කටයුතු කළ යුතු ය.

අරමුදලේ සංයුතිය

78. අරමුදලේ සංයුතිය පහත පරිදි වේ:

(1) පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව පිළියෙල කරනු ලබන පශු සම්පත් සංවර්ධන සැලැස්මට අනුව පළාත් සභා අරමුදලින් සපයනු ලබන අරමුදල්,

(2) රජයේ හෝ පළාත් සභා ආයතන විසින් ලබා දෙනු ලබන අරමුදල්,

(3) පළාත තුළ දෛනිකව කිරි ලීටර් 1000 ඉක්මවන, කිරි මිලදී ගන්නා ආයතනවලින් ලීටර් එකකට රුපියල බැගින් ලැබෙන දායකත්ව මුදල්,

(4) පළාත තුළ සත්ත්ව සංවර්ධනය සඳහා දායක වන දේශීය, විදේශීය රාජ්‍ය නොවන, පෞද්ගලික සංවිධාන මගින් කරනු ලබන පරිත්‍යාග හා ප්‍රදාන,

(5) ස්ථාවර තැන්පත් පොළිය,

(6) රක්ෂණ වාරික,

(7) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති ඇවර කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්තය,

(8) මෙම ප්‍රඥප්තියේ නියමයන්ට පටහැනිව සිදු කරන වරදවල් සඳහා අධිකරණය මගින් යොමු කරනු ලබන දණ්ඩන මුදල්,

(9) ණය වාරික හා පොළී මුදල්,

(10) ආයතන හා ගොවිපල් ලියාපදිංචි කිරීමේ ගාස්තු,

(11) වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල්.

79. කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව වයඹ පළාත් මූල්‍ය රෙගුලාසි හා විධිවිධානයන්ට අනුව පහත කරුණු සම්බන්ධයෙන් අරමුදලේ මුදල් යෙදවීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට හැක්කේය. අරමුදලේ වියදම්

(1) ක්ෂීර ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ගෙවීම

(2) ප්‍රතිලාභීන් සඳහා ණය ලබාදීම

(3) රක්ෂණ වන්දි මුදල් ගෙවීම

(4) ආයතනික හා පරිපාලන වියදම

80. අරමුදලේ කාර්යභාරය පහත පරිදි වේ: අරමුදලේ කාර්ය භාරය

(1) කිරි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(2) සහන ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(3) රක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(4) ගොවීන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(5) පළාත් බද පර්යේෂණ කටයුතු;

(6) මානව සම්පත් සංවර්ධනය;

(7) වයඹ පළාත තුල ලියාපදිංචි කිරි නිෂ්පාදන සමිතියක නිත්‍ය සාමාජිකයින්ගේ පවුල්වල සුබසාධන කටයුතු .

81. රජයේ විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම විගණනය කළ යුත්තේය. ගිණුම් විගණනය

82. අරමුදලේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන නියෝග පැනවීමට විෂයභාර අමාත්‍යවරයාට හැකිවන්නේය. නියෝග පැනවීම

83. (1) කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අරමුදලේ කාර්යයන් විෂයභාර අමාත්‍යාංශය සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය මගින් ඉටු කර ගත යුත්තේය. අරමුදලේ කාර්ය මණ්ඩලය හා පාරිශ්‍රමික

(2) කාර්ය මණ්ඩල කටයුතු සඳහා අතිරේක පාරිශ්‍රමිකයන් ගෙවිය යුතු අවස්ථාවන්හිදී අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ ගෙවිය හැකි වන්නේය.

## IX වන කොටස

## පොදු විධිවිධාන

**84.** (1) ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්, මඟ පෙන්වීම් හා නියෝග නිකුත් කිරීම අමාත්‍යවරයා විසින්කළයුතු වන්නේය. අමාත්‍යවරයා සතු බලතල

(2) ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ සඳහන් කොට්ඨාස නිර්ණය කිරීම අමාත්‍යවරයා විසින් කළයුතු අතර *ගැසට් පත්‍රයේ* පළ කළ යුත්තේය.

(3) පළාත තුළ හා පළාතෙන් පිටතට සතුන් ප්‍රවාහනයේදී අවස්ථානුකූලව සීමා පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

(4) පළාත තුළ සත්ත්ව රෝග වැලැක්වීම, පාලනය කිරීම සඳහා නියෝග පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

85. (1) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පල කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් දිනක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු වන්නේය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ යටතේ කලින් කරනු ලැබූ යම් කරුණකට අගතියකින් තොරව පරිච්ඡින්න විය යුතු අතර, ඒ පිළිබඳව නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

අභියාචනා බලතල

86. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධාරියකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන ඕනෑම අයෙකුට අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැක්කේය.

(2) අමාත්‍යවරයාගේ නියෝග මත ලේකම්වරයා විසින් පත් කරනු ලබන නිළධාරියකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයක නිර්දේශ මත එම නියමය හෝ තීරණය තහවුරු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනය කිරීම අමාත්‍යවරයාට කළ හැකි වන්නේය.

තොරතුරු ලබා ගැනීමේ අයිතිය

87. පශු සම්පත් ක්ෂේත්‍රයේ තොරතුරු ඉල්ලනු ලබන ඕනෑම අවස්ථාවකදී මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ ලියාපදිංචි සියළුම පාර්ශව විසින් අදාල තොරතුරු නිවැරදිව පළාත් අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු වන්නේය.

මාසික වාර්තාව

88. මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ ලියාපදිංචි පළාතේ නිෂ්පාදිත කිරි, මස්, බිත්තර මිළදී ගන්නා සියළුම ආයතන විසින් මාසයක් තුළ තමන් මිලදී ගත් ප්‍රමාණය පිළිබඳව මාසික වාර්තාවක් පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ආකෘතියකට අනුකූලව එළඹෙන ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

දායකත්ව මුදල

89. මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ ලියාපදිංචි පළාත තුළ දෛනිකව කිරි ලීටර් 1000 ට වඩා වැඩියෙන් කිරි මිළදී ගන්නා ආයතනවලින් ලීටර් එකකට රුපියල බැගින් දායකත්ව මුදලක් ක්ෂීර ප්‍රවර්ධන අරමුදලට ගෙවිය යුත්තේය.

ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීම

90. පළාත තුළ කිසියම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් පශු සම්පත් ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, සේවා සැපයීම සහ පර්යේෂණ උදෙසා කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවේ අනුමැතිය ලබා ගත යුත්තේය.

ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම.

91. 1998 අංක 04 දරන වයඹ පළාත් සත්ත්ව පාලන ප්‍රඥප්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

## X වන කොටස

## වැරදි හා දඩුවම්

විධිවිධාන හෝ නියෝග උල්ලංඝණය කිරීම

92. මෙම ප්‍රඥප්තිය යටතේ පනවා ඇති විධිවිධාන හෝ නියෝග උල්ලංඝණය කරනු ලබන ඕනෑම පුද්ගලයෙක් ආයතනයක් හෝ සංවිධානයක් වරදකට වරදකරු වන්නේය.

වැරදි

93. මෙම ප්‍රඥප්තියේ සඳහන් යම් විධිවිධානයක් කඩ කරන හෝ එකඟව කටයුතු කිරීම පැහැර හරින ඕනෑම තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයෙකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට රු.100,000.00 කට නොවැඩි දඩයකට හෝ මාස 12 ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළයුතු වන්නේය.

94. (1) මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය පළාත් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු සතු වන්නේය.

(2) මෙම ප්‍රඥප්තියේ 92 වන වගන්තිය යටතේ අධිකරණයෙන් නියම වන්නා වූ දඩ මුදල් ක්ෂීර ප්‍රවර්ධන අරමුදලට ලබාගැනීමට පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියා විසින් කටයුතු කළ යුතු ය.

නඩු පැවරීමේ බලය හා දඩමුදල් අරමුදලට ලබාගැනීම.

## XI වන කොටස

## අර්ථ නිරූපන

95. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

අර්ථ නිරූපන

පළාත, යන්නෙන් වයඹ පළාත ද,

ආණ්ඩුකාරවරයා , යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ද,

අමාත්‍යවරයා, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයා ද,

ප්‍රධාන ලේකම්, යන්නෙන් වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ද,

පළාත් අමාත්‍යාංශය, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශය ද,

ලේකම්වරයා , යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

දෙපාර්තමේන්තුව, යන්නෙන් වයඹ පළාතේ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ද,

අධ්‍යක්ෂවරයා, යන්නෙන් වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා ද,

පළාත්බද පර්යේෂණ, යන්නෙන් පළාත් මට්ටමින් පශු සම්පත් සංවර්ධන ක්‍රියාවලියේදී ඇතිවන්නා වූ තාක්ෂණික ගැටළු හා ඒ සම්බන්ධ ගැටළු තත්ත්වයන් නිරාකරණය කිරීම සහ නව සොයා ගැනීම් සඳහා නිර්දේශ ලබා ගැනීම සහ හඳුන්වා දෙනු ලබන තාක්ෂණ හා නිර්දේශවල අදාළත්වය තහවුරු කිරීම සඳහා පළාත් මට්ටමින් කරනු ලබන (මූලික සිද්ධාන්ත ගොඩනැගීම සඳහා නොවන) අත්හදා බැලීම් ද,

ගොවිපල, යන්නෙන් එළගවයින්, මීගවයින්, එළුවන්, බැටළුවන්, ඌරන්, සාවුන්, කුකුළන්, වටුවන්, තාරාවන් හා කළුකුන් යන සතුන් ඇති කරන හා නඩත්තු කරන ඒකක ද,

නිෂ්පාදනාගාරයක් , යන්නෙන් පශු සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත ආහාර ද්‍රව්‍ය, භාණ්ඩ, උපකරණ, ඖෂධ, සත්ත්ව ආහාර සකස් කරන හෝ අගය එකතු කරන ස්ථානයක් ද,

පශු සම්පත්, යන්නෙන් එළගවයින්, මීගවයින්, එළුවන්, බැටළුවන්, ඌරන්, සාවුන්, කුකුළන්, වටුවන්, තාරාවන් හා කළුකුන් යන සතුන් ද,

රාජ්‍ය බැංකු, යන්නෙන් ලංකා බැංකුව, මහජන බැංකුව, ඉතිරි කිරීමේ බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ද,

සාධාරණ කාලය, යන්නෙන් යම් කරුණකට අදාළව එහි ස්වාභාවය අනුව අවස්ථානුකූලව පළාත් අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන කාලයක් ද,

යෝග්‍යතා සහතික, යන්නෙන් සත්ත්ව ප්‍රවාහනයට අදාළ වාහනයේ සුදුසුකම් ද,

ග්‍රාමීය සමිති, යන්නෙන් ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති ද,

අලෙවි සල, යන්නෙන් පශු සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත ආහාර ද්‍රව්‍ය, භාණ්ඩ, උපකරණ, ඖෂධ, පශු සම්පත් නිෂ්පාදන අලෙවි කරන ස්ථානය ද,

ශීතාගාරය, යන්නෙන් පශු සම්පත් නිෂ්පාදන පරිහරණය තෙක් ගබඩා කරන ස්ථානය ද,

අදහස් වේ.

96. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා සහ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.